# චන්ද්‍රිකා

## හිටපු ජනාධිපතිනිය අහිමිවීම හා අහිමි කිරීම ප්‍රශ්න දෙකට මැදිව



සීවලි එදිරිවීර

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපතිනිය වන අතර වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඊළඟ ජනාධිපති මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා ලෙස නම් කරන්නේද ඇය විසිනි.

එහෙත් නොබෝ කලකින් මේ දෙදෙනා අතර ඇති වන විරසකය මේ වනවිට බොහෝ උත්සන්න වී අවසන්ය. ඒ නිසා මංගල සමරවීර හා ශ්‍රීපති සූරියආරච්චි යන හිටපු ජනාධිපතිනියගේ හිතවතුන් දෙපල එක්සත් ජාතික පක්ෂය සමඟ එක්වී ජාතික සභාවක් ගොඩ නගා ගෙන දේශපාලනයේ නිරතව සිටිති.

එම කටයුත්තට හිටපු ජනාධිපතිනියගේ පූර්ණ සහය ලැබෙන බව වාර්තා විය.

මේ අතර පසුගියදා සිදුවූ හිටපු ජනාධිපිතිනය විසින් ඇගේ දියණියගේ විවාහ මංගල්‍යය වෙනුවෙන් ශ්‍රී ලාංකික නෑ හිත මිතුරන් සඳහා ගල්කිස්ස මහ හෝටලයේදී ප්‍රිය සාදයක් පවත්වනු ලැබීය. එයට සමහර ආණ්ඩු පක්ෂ මැති ඇමැතිවරු පිරිසක් මෙන්ම විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු පිරිසක් ද සහභාගි වී තිබුණි.

කෙසේ වුවත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට හෝ එම පවුලේ කිසිවෙකුට ඒ සඳහා ඇරයුම් කර නොතිබූ බවද වාර්තා විය. මේ නිසා ශ්‍රී ලංකාවේ ජනාධිපති තනතුර හෙබවූ කෙනෙකු හා රට පාලනය කරනු ලබන ජනාධිපතිවරයෙකු අතර ඇතිවන අරගල පිළිබඳව පළමුවරට කථා කිරීමේ අවස්ථාවක්ද දැන් ජනතාවට ලැබී ඇත.

හිටපු ජනාධිපතිනිය විසින් සිදුකරණ ලද පැවරීමක් හේතුවෙන් තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංගණය වූ බව පවසමින් පසුගියදා පුද්ගලයින් දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කර තිබුණි.

ඉන් ඔහු ප්‍රකාශ කර තිබුණෝ පාර්ලිමේන්තු සංකීර්ණ ආසන්නයේ පිහිටි අක්කර 136 ක් විශාල ඉඩමක් ඇයගේ අභිමතය පරිදි ''වෝටර් ඒජ්'' නම් වූ ගොල්ෆ් ක්‍රීඩා සමාජයක් සහිත සුපිරි පන්නයේ ව්‍යාපෘතියකට ලබා දී ඇති බවය. එහෙත් එහි ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා ක්‍රිකට් හා පාපන්දු ක්‍රීඩාවන්ට සුදුසු ක්‍රීඩාංගණයක් ඉදිකිරීමට ඊට පෙර සැලසුම් කර තිබූ බවද ඔවුන්ගේ පෙත්සමේ සඳහන් වේ.

එහෙත් හිටපු ජනාධිපතිනිය ඇගේ අභිමතය පරිදි කටයුතු කරමින් එම ඉඩම ''වෝටර් ඒජ්'' සඳහා පවරාදීමෙන් අද එහි ප්‍රයෝජන අත් විඳින්නේ ඉතාමත් ධනවත් පුද්ගලයින් අතලොස්සක් පමණක් බවත් ඒ අනුව මහජන යහපත සඳහා ප්‍රයෝජනයට ගත යුතු වූ ඉඩමක් හිතවත්කම් මත පවරා දීමෙන් ඇය තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇතැයි වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව එම ගණුදෙනුව බල රහිත කොට සුදුසු පරීක්ෂණයක් පවත්වන ලෙසත් රුපියල් මිලියන 100 ක වන්දියක් තමන්ට ලබාදෙන ලෙසත් පෙත්සම්කරුවෝ ඉල්ලා සිටිති.

මෙම පෙත්සම අධිකරණයට ඉදිරිපත් කොට දින කිහිපයකට පසු හිටපු ජනාධිපතිනියද වත්මන් ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා ඇතුළු පිරිසකට එරෙහිව අභියාචනාධිකරණයේ පිහිට පැතුවාය.

ඇය ඉදිරිපත් කරනු ලැබූ පෙත්සමේ සඳහන් කර ඇත්තේ ජනාධිපති ලේකම්වරයාගේ නියමයෙන් තම මූලික වරප්‍රසාද උල්ලංඝණය වී ඇති බවකි.

වර්ෂ 1986 අංක 4 දරණ ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනත අනුව හිටපු ජනාධිපතිවරුන්ට ලැබිය යුතු දීමනා හිමිකම් හා පහසුකම් රැසක් ජනාධිපති ලේකම්වරයා විසින් තමන්ට අහිමි කර ඇති බැවින් ලේකම්වරයාට එරෙහිව රිට් ආඥාවක් නිකුත් කරණ ලෙස හිටපු ජනාධිපතිනිය අභියාචනාධිකරණයෙන් ඉල්ලා තිබුණි.

මේ අනුව දැන් හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය මූලික අයිතිවාසිකම් අහිමිවීම හා අහිමි කිරීම යන ප්‍රශ්ණ දෙකටම මැදි වී සිටින්නීය.



## තිදරු මවට උපකාර කරන්න

පමුණුගම බෝපිටියේ අංක 371ඒ දරන ලිපිනයේ පදිංචි 38 හැවිරිදි ජේ ඒ ඩී චම්පා ගෞරි මහත්මිය දරුණු වකුගඩු ආබාධයකින් පෙළෙන බැවින් ඇය සුවපත් කිරීම සඳහා ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව විශේෂඥ වෛද්‍ය රුචික ලැනරෝල් මහතා නිර්දේශ කර ඇත.

ආර්ථික වශයෙන් මහත් දුෂ්කරතාවෙන් පෙළන බැවින් තිදරු මවක් වන ගෞරි මහත්මියගේ සැත්කමට අවශ්‍ය විශාල මුදල දැරීම සොයාගැනීම ද බැරෑරුම් ප්‍රශ්නයක් වී ඇත. ඇයට යම් උපකාරයක් කිරීමට පිරිත්‍යාගශීලී ඔබ කැමැති නම් මහජන බැංකුවේ පමුණුගම ශාඛාවේ 318 - 2 - 001 - 8 - 8357767 දරණ ගිණුමට ඔබේ පරිත්‍යාග යොමු කරන මෙන් ඇය ඉල්ලා සිටියි.

1st September 2007

Transformation of current Australian Migration system......

- New visa structure for skill Migration
- Higher English threshold
- Restrictions for Overseas Students to apply directly for Permanent Residence

This means that those who may qualify today may not qualify after 1st September 2007

We will ensure our commitment to provide the most technically accurate advice to explore and secure the best possible migration option under the existing legal framework for you, your relative or friend.......

Susantha Katugampala

SUSANTHA KATUGAMPALA
LL B (Monash)
Barrister & Solicitor
Registered Migration Agent: 96/86306
Australian qualified
and experienced Sri Lankan Lawyer

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

10, Morrison Place, East Melbourne 3002
Telephone: 61 3 9650 4557 Fax: 61 3 9650 4559
Interstate Callers: 1300 888 331

Email: info@fairfieldslawyers.com

We Deliver Results.....

GUSS F001 0402 894 942